

# සම්ප්‍රදායට අභියෝග කළ




*වචනයකට යා හැකි උපරිම දුර ගෙවා ගිය තැන ඇත්තේ සංගීතය නම් සංගීතය යනු මිනිසෙකුට තම කථන භාෂාවෙන් කියා නිම කළ නොහැකි හැඟීම් සමුදායක් ප්‍රකාශ කළ හැකි ලොව පවතින අපූර්වතම වූත් ආකර්ෂණීයම වූත් මාධ්‍යයයි. එසේම රිද්මය යනු සංගීතයේ කූටප්‍රාප්තිය ද වන්නේය. විශ්වයේ සිටින සියලූම ජීවීන් එකිනෙකට බැඳ තබන අගනා හුය වන්නේද ඒ රිද්මයයි. සංගීතය නැතහොත් මියැසිය පිළිබඳව විශ්වීය අත්දැකීමක් මෙල්බර්න් නුවර වෙසෙන සංගීත ශ්‍රාවකයන්ට "සංගීතාත්මය" ප්‍රසංගය තුළින් සමීප කරවූ සොඳුරු නිර්මාණකරුවා - දර්ශන රුවන් දිසානායක සිය සංගීත භාවිතාව පිළිබඳව සිදුකළ විවරණයකි මේ.*

සංවාදය
**උපේක්ෂා සේනානායක**

**මෙල්බර්න් නුවර ප්‍රේක්ෂකාගාරය පිළිබඳව ඔබ තුල තිබූ පූර්ව විනිශ්චයන් හා ඔබේ සැබෑ අත්දැකීම් අතර කිසියම් පරස්පරතාවක් තිබේද ?**

මගේ සංගීත භාවිතාවේ පදනම බටහිර සම්භාව්‍ය සංගීතය වුවත් ඒ මත මවිසින් මුද්‍රාහරිනු ලබන්නේ ශ්‍රීලාංකීය ජන නාද රටා වල පවතින අලංකාරයයි. එනිසා නිසැකවම ප්‍රේක්ෂකාගාරයේ රසඥතාව චින්තනය මෙන්ම වපසරිය පිළිබඳව මා තුල තිබූ පූර්ව විනිශ්චයන් නිවැරදි බව මට හැඟී ගියා. මා තනු නිර්මාණය කළ මේ තරම් සියුමැලිද කලූ ගල් සහ සමනළ සංධ්වනිය සිනමාපටයේ ගීත පුලූල් පරාසයක විසිරුණු රසික පිරිසක් වැලඳ ගත් නිසා ගීතයෙන් ඔබ්බට ගිය සංගීතමය අත්දැකීමක් මෙල්බර්න් නුවර ලාංකීය ප්‍රේක්ෂකයන් වෙත සමීප කරවීම පහසු කටයුත්තක් වුණා. මා ඒ ගැන තෘප්තිමත්.

නමුත් සංගීතය යන පොදු භාෂාවට භේදයන් නොතිබිය යුතු බව මා තරයේ විශ්වාස කරන නිසා ශ්‍රී ලාංකිකයන් හැරුණු කොට ඕස්ට්‍රේලියානුවන් පවා අපේ නිර්මාණ කෙරෙහි සවිඥානික විමත් එම නිර්මාණ රසවින්දනය කර ඒවා ප්‍රත්‍යක්ෂ කර ගැනීමත් මගේ පෙර කී පූර්ව විනිශ්චයන් යම් තාක් දුරකට අතික්‍රමණය කිරීමක් ලෙස මා දකිනවා. එනිසා මීටත් වඩා පුළුල් ඕස්ට්‍රේලියානු ප්‍රේක්ෂක ප්‍රජාවකට අපේ නිර්මාණ රසවිඳීමේ අවස්ථාව උදා කර දිය යුතුය යන හැඟීම මා තුල බලවත්ව ගොඩ නැගීමට ඔවුන්ගෙන් ලද ප්‍රතිචාර ඉවහල් වූ බව කිවයුතුයි. ලෝක සාමය උදෙසා මවිසින් නිර්මාණය කළ මහා විශ්වයේ දුර්ලභ මිනිසා යන ගීතය මොනෑෂ් විශ්වවිද්‍යාලයට ලබා දීමට මට අවස්ථාව ලැබුණා. එම විශ්ව විද්‍යාලය තුළ ප්‍රසංගයක් පැවැත්මටත් මට ආරාධනා ලැබුණා. එළබෙන වසරේදී මා විසින් මෙල්බර්න් හිදි පැවැත්වීමට නියමිත ප්‍රසංගය ඕස්ට්‍රේලියානු ශ්‍රාවකයින් මූලිකවම අරමුණු කරගෙන පැවැත්වේවි. විශ්ව සංගීතය මගින් ඕනෑම රටක ඕනෑම භාෂාවක් කථා කරන පුද්ගලයෙකුගේ සුභාවිත හැඟීම් උද්දීපනය කළ හැකි බවත් ඔහුව ඥානනය කළ හැකි බවත් මා විශ්වාස කරනවා. අප ඒ පොදු ධර්මතාව වටහා ගත යුතුයි. ගීතය යන ආකෘතියෙන් මිදුණු විට පුලූල් පරාසයක විහිදෙන මියුරු සංගිත නිර්මාණ බොහොමයක් රසවිඳිය හැකියි. මෙයින් ගම්‍ය වෙන්නෙ නැහැ මා ගීත විරෝධියෙක් කියා. ගීතය අතිශයින්ම ආකර්ෂණීය මාධ්‍යයක්. නමුත් අප එතැන නතර විය යුතු නැහැ. එවිට ශ්‍රී ලාංකීය සංගීතයේ සලකුණ අපේ කම අපේ ජන නාද මාලා වල තිබෙන වටිනාකම ලෝකයට ගෙන යෑම වඩාත් පහසු වේවි

මා විසින් අත් හදා බලන ලද සංගීත නිර්මාණ බොහොමයක් ඕස්ට්‍රේලියානුවන් විසින් ප්‍රීතියෙන් වැලඳගනු ලැබීමේ බුහුමන අයත් වන්නේ පෞද්ගලිකව මට නොවේ අපේ රටටයි. එනිසා මේ සංචාරය මා තුල සැබෑ සතුටක ඇති කළා යැයි කීම අතිශයෝක්තියක් නොවේ.

**සංයුක්ත ඔපෙරාව හඳුන්වා දීම තුලින් ඔබ ආමන්ත්‍රණය කිරීමට බලාපොරොත්තු වෙන ශ්‍රාවකයා කවර ආකාරයේ කෙනෙක්ද?**

ඇත්තෙන්ම බහුතරය වටහා ගෙන සිටින්නේ සංගීතයට යා හැකි උපරිම දුර ගීතයෙන් අවසන් වෙන බවයි. එය එසේ නොවන බවට බිම්මට්ටමේ සිටින සාමාන්‍ය ජනතාව තුල දැනීමක් අවබෝධයක් සහ යම්කිසි සංවේදී භාවයක් ඇති කිරීමේ පරමාර්ථය ඇතුව මවිසින් හඳුන්වා දෙනු ලැබූ සංකල්පය සංයුක්ත ඔපෙරාවයි. එය බටහිර සම්භාව්‍ය සංගිතයේ හමුවන විශිෂ්ඨතම නිර්මාණයක් වන ඔපෙරාවේ අන්තර්ගත සියලූම ලක්ෂණ ප්‍රකට කරන ප්‍රාසාංගික අත්දැකීමක්. ගීතයේ ධාවන කාලයට සමාන ධාවන කාලයක් තුළට ඔපෙරාව සංගෘහිත කර සංක්ෂිප්ත කිරීම මගින් සුභාවිත සංගීතයෙන් දුරස්ව සිටින සාමාන්‍ය ජනතාව වෙත එහි රසය සමීප කරවීම තමා මගේ මුඛ්‍ය අරමුණ වුණේ.

එසේම 2009 වසරේදී මවිසින් නිර්මාණය කරන ලද බෞද්ධ කැන්ටාටාව උසස් රසවින්දනයකින් හෙබි රසිකයින් විසින් වැලඳගත්තා. මෙතෙක් කල් ලෝකයේ කැන්ටාටා නිර්මාණය වී තිබුණේ කිතු දහම පදනම් කරගෙනයි. නමුත් චක්කවත්ති සිහනාද සූත්‍රය ඇසුරෙන් මවිසින් ගොඩනැගූ මෙම බෞද්ධ කැන'ටාටාව මගේ දැනුමේ හැටියට පලමු බෞද්ධ කැන'ටාටාව වන අතර මෙතෙක් බිහිවූ දීර්ඝතම කැන්ටාටාවද වනවා. ප්‍රභා කුමාර රාජගුරු කියන දක්ෂ පද රචකයා විසින් මෙහි පද පෙළ නිර්මාණය කරනු ලැබුවා. විනාඩි පනහක් පමණ කාලයක් තුල ගායනා කරනු ලබන මේ කැන්ටාටාව ප්‍රාසාංගික ලක්ෂණ වලින් තොරවීම හේතුවෙන් තමා එය ඔපෙරාවකින් වෙනස් වන නිර්මාණයක් බවට පත්වෙන්නේ. අප කිසිදු සංගීත සම්ප්‍රදායක් ලඝු කොට නොසැලකිය යුතු නමුත් අපේ ජන සංගීතයේ එන නාද රටා වලින් දියුණු නිර්මාණ බිහි කළ හැකි බව අප මතක තබා ගත යුතුයි. එම සංකල්පය පලමුව අත්හදා බැලූ සංගීතඥයා ලෙස මා දකින්නේ සුනිල් ශාන්තයන්වයි. ඉන්පසුව සෝමදාස ඇල්විටිගලයන් ඊට තවත් දිගුවක් එක් කරමින් වටිනා නිර්මාණ බොහොමයක් සිදුකළා.
සංයුක්ත ඔපෙරාව අපේක්ෂිත රසික පිරිස විසින් වැලඳගත්තා. එනිසා සම්ප්‍රදාය තුල සිරනොවී නිදහස් මනසින් නිර්මාණ කිරීමට පෙළඹීමට මේ හොඳම කාලයයි.

**ඔබගේ සංගීත නිර්මාණ දේශීය වශයෙන් අවශ්‍ය ඇගයීමට ලක්වුවායැයි ඔබ පෞද්ගලිකව විශ්වාස කරනවාද?**

ඇත්තෙන්ම මා ඒ පිළිබඳව තෘප්තිමත්ග2011 සහ 2013 වසර වල හොඳම සංගීතඥයාට හිමි රාජ්‍ය සම්මානයත් 2014 වසරේදී Lanka live film awards වෙතින් සමනළ සංද්ධ්වනිය චිත්‍රපටය වෙනුවෙන් හොඳම සිනමා සංගීතඥයාට හිමි සම්මානයත් මට හිමිවුණා. එසේම ඈත ගම්බද පළාත් වල ජීවත් වන අහිංසක ගැමියන් පවා මගේ නිර්මාණ රසවිඳ මා වෙත දක්වන ප්‍රතිචාර මා ලබන උත්තම ජනතා සම්මානය ලෙසින් මට දැනෙනවා. නිසැකයෙන්ම මා පසුපස සිටින හෘදයාංගම ශක්තිය වන්නේද ඔවුන්ගේ ආශිර්වාදයයි.

**ලංකාවේ අද පවතින රියැලිටි වැඩසටහන් වල විනිශ්චය ආසන වල ඔබ දක්නට නැත්තේ ඇයි?**

ඒ සඳහා සෘජු පිළිතුරක් ගොනු කළ හැකියි. නොයෙකුත් නාලිකා වලින් මට විනිශ්චය අසුනට ආරාධනා ලැබුණා. නමුත් මගේ පෞද්ගලික මතය නම් රියැලිටි වැඩසටහන් හරහා සිදුවන්නේ ආධුනිකයන් ගොනාට ඇන්දවීම විනා ඔවුන් පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබා දීම නොවේ. එනිසා ඒ යාන්ත්‍රණය තුල අපට එකඟ විය නොහැකි කාරණා එමටයි. නිවසේ රැඳී සිටින ප්‍රේක්ෂකාගාරය පවා රවටන විනිශ්චයන් ලැබෙන වාතාවරණයක මට පෞද්ගලිකව දැනෙන නියම දේ අව්‍යාජව සහ නොපැකිළව ප්‍රකාශ කිරීමට ඉඩ ලැබේ නම් පමණක් මා විනිසුරු අසුනේ හිඳ ගනීවි. ලක්ෂ සංඛ්‍යාත ප්‍රේක්ෂක පිරිසකට පැහැදිලිව තේරෙන දේ මට නොතේරෙන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම මොනතරම් රැවටීමක්ද? මා කෙරෙහි ජනතාව තුල තිබෙන විශ්වාසයත් ජනතාවගේ බුද්ධියත් සමඟ සෙල්ලං කිරීම මට අතිශයින් අසීරු කරුණක්.

**ලංකාවේ වත්මන් සිනමා සංගීතය තුල පවතින නිර්මාණ බංකොලොත් භාවය ඔබ අර්ථකථනය කරන්නේ කෙසේද ?**
සිනමා සංගීතය තුල පවතින මූලික අර්බුදය වන්නේ සංගීතඥයන් හා ඇතැම් සිනමාකරුවන් අතර පවතින භාවිතාවේ පරතරයයිග සිනමා සංගීතඥයාට වඩා ඇතැම් සිනමා අධ්‍යක්ෂකවරුන් සෑහෙන පසුපසින් සිටින නිසා නිර්මාණය තුල සංගිත භාවිතාවේ අරුමය හොඳින් පෙන්වාදීමට ඇති අවකාශය ඇහිරෙනවා. ඇතැම් සිනමා අධ්‍යක්ෂක වරුන් ප්‍රාථමික මට්ටමේ සංවේතාවයක සිටීම තරමක ගැටලූවක්. සිනමා ක්ෂේත්‍රයට නව පරම්පරාවක අවශ්‍යතාව සහ හිඟපාඩුව තදින් දැනෙනවා. එමෙන්ම ලෙස්ටර් ජේම්ස් පීරිස් ධර්මසිරි බණ්ඩාරනායක ධර්මසේන පතිරාජ සහ තිස්ස අබේසේකර වැනි විද්වත් සිනමාකරුවන් සිනමා සංගීතඥයන් සමඟ ප්‍රශංසනීය සහ බුද්ධිමය සබඳතාවක් යහපත් ලෙස ගොඩනගා ගනු ලැබීම සාධනීය ලක්ෂණයක් ලෙස අප හඳුනාගෙන තිබෙනවා. නමුත් ඔවුන්ටද ලෝක සිනමාව වෙත සමීප වීමට අවැසි තාක්ෂණික පසුබිම සපිරෙනවාද යන්න එක්තරා ගැටලූවක්.

**ලාංකීය සිනමාව ඓතිහාසික සිනමා නිර්මාණ රැල්ලක් තුළ අතරමංවීමේ දුර්භාග්‍ය ඔබට දැනෙන්නේ කවර ආකාරයෙන්ද?**

ලංකාව යනු ලෝකයක් නිවැරදි කළ මිනිසුන් සිටින රටක්. එමෙන්ම ඉතිහාසය යනු අප කාගෙත් උරුමයක් සහ අයිතියක්. ඉතිහාසය විකෘති කර විශ්වාස රහිත දෙයක් බවට පත් කිරීමට ඉඩ නොතැබීමේ වගකීම අප කාටත් අනාගතය විසින් පවරා තිබෙනවා. අතීතය යනු අනාගතයම වන බැවින් අතීතය විකෘති කිරීම යනු වෙනස් ආකාරයකින් අනාගතය විකෘති කර ජනතාව මංමුලාකිරීමක් බව පුන පුනා කිව යුත්තක් නොවේ. එබැවින් අනාගතය රැක ගැනීමටත් අතීතයට හිමි විශ්වසනීයත්වය අනවරතව පවත්වාගෙන යාමටත් අප පෙළගැසිය යුතු බව අවසන් වශයෙන් අවධාරණය කරන්න කැමතියි.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com